**සැ. යු.** - 2017.08.25 වැනි දින පළ වූ අංක 2034 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවිය


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,035 - 2017 අගෝස්තු මස 31 වැනි බ්‍රහස්පතින්දා - 2017.08.31**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 1326 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 1328 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1333 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සැ. යු.** - ශ්‍රී ලංකා රිෆායි තරීක් සංගමය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත 2017 අගෝස්තු මස 25 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 සැප්තැම්බර් මස 22 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 සැප්තැම්බර් මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


1325 – B 081203 — 403 (2017/08)
A 1-

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2017 අංක 1019

MOD/DEF/02/01/ARF/RET/1481.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල උසස් කිරීමක් සහ විශ්‍රාම ගැන්වීමක්

**නිල උසස් කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2017 අගෝස්තු මස 09 වැනි දින සිට බ්‍රිගේඩියර් නිලයට නිල උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කර්නල් පෙත්තාවඩු තුෂාන්ත මනෝජ් ද සිල්වා, යූඑස්පී (නි/60607)

**විශ්‍රාම ගැන්වීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2017 අගෝස්තු මස 10 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ ස්ථිර බල හමුදවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

බ්‍රිගේඩියර් පෙත්තාවඩු තුෂාන්ත මනෝජ් ද සිල්වා, යූඑස්පී (නි/60607)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දී ය.

08 - 1044

---

MOD/DEF/02/01/ARF/CW/1480.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් නියම කරන ලද අධිකාරියෙන් ඉවත් කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදවෙන් පහත නම සඳහන් නිලධාරී 2017 අගෝස්තු මස 17 වැනි දින සිට අධිකාරියෙන් ඉවත් කිරීමට අතිගරු ජනාධිපති උතුමාණන් විසින් නියම කර ඇත.

ලුතිනන් තිස්ස මුදියන්සේලාගේ තිස්ස අනුරංග, ආර්එස්පී. ශ්‍රීලසසබ (නි/66674)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දී ය.

08 - 1045

---

2017 අංක 1020

MOD/DEF/03/02/PRO/RNF/04/03.

**ශ්‍රී ලංකා නාවික හමුදව - නිත්‍ය නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

*2017 මාර්තු මස 28 වැනි දින සිට තාවකාලික රියර් අද්මිරාල් වශයෙන් :*

කොමදෝරු අගලවත්ත අශෝක ප්‍රින්ස්ලි ලියනගේ, ආර්එස්පී, යූඑස්පී, පීඑස්සී, ඒම්ඩබ්සී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0341

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 මාර්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.

08 - 971

---

2017 අංක 1021

MOD/DEF/03/02/RET/299.

**ශ්‍රී ලංකා නාවික හමුදව - නිත්‍ය නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක්

පහත නම සඳහන් නිලධාරියා 2017 නොවැම්බර් මස 10 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුද නිත්‍ය බලකායෙන්

විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ලුතිනන් කොමාණ්ඩර් (නාසෙ), තුසිත සම්පත් නවරත්න, එන්ආර්පී 1093, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දී ය.

08 - 1021

---

2017 අංක 1022

MOD/DEF/03/02/PRO/RNF/01/11.

**ශ්‍රී ලංකා නාවික හමුදව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2017 අප්‍රේල් මස 08 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් සජීව කිත්සර ජයවර්ධන, එන්ආර්එක්ස් 2352, ශ්‍රීලංනාහ

*2017 මාර්තු මස 29 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (විඅ) වශයෙන් :*

ලුතිනන් (විඅ) මාපටුන ගමගේ මාලන් චතුරංග මුනිදස, එන්ආර්ආර් 2435, ශ්‍රීලංනාහ

*2017 අප්‍රේල් මස 03 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් දිසානායක මුදියන්සේලාගේ අජිත් ප්‍රියරාජ් දිසානායක, එන්ආර්එක්ස් 2566, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දී ය.

08 - 1022

MOD/DEF/10/03/Reinstate/01.

**ශ්‍රී ලංකා ගුවන් හමුදව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද නැවත නිත්‍ය ගුවන් හමුද සේවයේ පිහිටුවීමක්

පහත නම සඳහන් නිලධාරියා 2017 මැයි මස 24 වැනි දින සිට ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුද සේවයේ නැවත පිහිටුවීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් හේරත් බණ්ඩාර මුදියන්සේලාගේ චන්දන විජේරත්න (02783) - පරිපාලන රෙජිමේන්තු

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දී ය.

08 - 1025

---

2017 අංක 1023

MOD/DEF/10/03/RES /91.

**ශ්‍රී ලංකා ගුවන් හමුදව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

2017 සැප්තැම්බර් මස 28 වැනි දින සිට ශ්‍රී ලංකා ගුවන් හමුදවේ පහත නම සඳහන් නිලධාරියාගේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් ධනුෂ්ක රුමාල් ගුණරත්න (03335) - දන්ත වෛද්‍ය

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දී ය.

08 - 1023

2017 අංක 1024

MOD/DEF/10/03/RES/90.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

**අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්**

2017 දෙසැම්බර් මස 31 වැනි දින සිට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පහත නම සඳහන් නිලධාරියාගේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ස්කොඩ්රන් ලීඩර් උඩුවරගේ දොන් මංජුල පුෂ්පකුමාර (02946) - විද්‍යුත් ඉංජිනේරු

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දී ය.

08 - 1026

2017 අංක 1025

MOD/DEF/10/03/RET /176.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

**අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්**

2018 පෙබරවාරි මස 4 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නා ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් කරුණාරත්න වාසල මුදියන්සේලාගේ චමින්ද කුමාර කරුණාරත්න (02841) - පරිපාලන රෙජිමේන්තු

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දී ය.

08 - 1024

---

# රජයේ නිවේදන

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/47/2017/පිටු/සැ.

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස්කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස්කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2017.09.01 වැනි දින සිට 2017.09.15 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2017.09.22 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

නීල් ද අල්විස්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් කොට්ඨාසයේ 84 වෙළුමේ 57 පත්‍රිරුව | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, උඩුගහ පත්තුවේ, සල්පිටි කෝරළේ, සියඹලාගොඩ පිහිටි 'දූවිලියගහවත්ත' නමැති ඉඩම සඳහා මායිම්,<br><br>උතුර : ඩබ්ලිව්. ඒ. සුවාරිස් අප්පුට අයිති මෙම ඉඩමේම කොටසක්,<br>නැගෙනහිරට : වතුරුදෙණිය,<br>දකුණ : ඩබ්ලව්. ඒ. කෝර්නේලිස්ට අයිති. මෙම ඉඩමේම කොටසක්,<br>බස්නාහිර : මහ පාර,<br><br>ප්‍රමාණය : අ. 02, රූ. 0, පර්. 0 | 01. ජේ. එස්. විජයසේකර ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1957.01.26 වැනි දින ලියා සහතික කරන ලද අංක 3831 දරන විකුණුම්කරය.<br><br>02. ඩබ්ලිව්. එම්. පී. විජේසුන්දර ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1957.08.25 වැනි දින ලියා සහතික කරන ලද අංක 66 දරන තෑගි ඔප්පුව.<br><br>03. ඩබ්ලිව්. එම්. පී. විජේසුන්දර ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1975.04.13 වැනි දින ලියා සහතික කරන ලද අංක 22199 දරන තෑගි ඔප්පුව. |

08 - 966

---

**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - මණ්මුනේ බස්නාහිර, වවුනතීවු, නාවක්කාඩු**

ආයිතියමලේ සඳසරණ මැණියෝ දේවස්ථාන වාර්ෂික උත්සවය - 2017

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1991 නොවැම්බර් මස 01 වැනි දිනැති අංක 687 දරන *ගැසට් පත්‍රයේ* පළකර තිබූ නිවේදනය අනුව යාත්‍රා ආඥපනතේ 2 වැනි වගන්තිය (175 වැනි අධිකාරය වූ) යටතේ ආයිතියමලේ සඳසරණ මැණියෝ දේවස්ථානයේ වාර්ෂික උත්සවය මඩකලපු දිස්ත්‍රික්කයේ මණ්මුනේ බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 2017.08.25 වැනි දා කොඩි එසවීමෙන් ආරම්භ වී 2017.09.03 වැනි ද තෙක් පැවැත්වේ යැයි මෙයින් ප්‍රකාශ කරමි.

එස්. සුතාකර්,
ප්‍රාදේශීය ලේකම්,

2017 අගෝස්තු මස 09 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මණ්මුනේ බටහිර,
වවුනතිවු.

08 - 967

---

**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - එරාවූර් පත්තු, චෙංකලඩි**

වන්දනා ගමන් ආඥපනත

**සිත්තාන්ඩි ශ්‍රී චිත්‍රවේලායුධ ස්වාමි කෝවිල් උත්සවය - 2017**

යථෝක්ත උත්සවය 2017 අගෝස්තු මස 22 වැනි දින පටන් ගෙන 2017 සැප්තැම්බර් මස 06 වැනි දින දක්වා පවත්වන මෙම උත්සවයට වන්දනා සඳහා පැමිණෙන අයගේ සහ අනෙකුත් සියලු දෙනාගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශ කරමි.

1984.07.16 වැනි දින අංක 9866 දරන ආණ්ඩුවේ *ගැසට් නිවේදනයේ* සඳහන් නිත්‍ය නියෝගයන් කෙරෙහි මෙම උත්සව සමයේ දී උත්සවයට පැමිණෙන සියල්ලන්ගේ හා අනෙකුත් අයගේ අවධානය තකා මෙයින් යොමු කරමි.

ප්‍රාදේශීය ලේකම්,
එරාවූර් පත්තු.

2017 අගෝස්තු මස 09 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
එරාවූර් පත්තු,
චෙංකලඩි.

08 - 969

---

## ප්‍රාදේශීය මහා ලේකම් කාර්යාලය - හඟුරන්කෙත

### හඟුරන්කෙත ඓතිහාසික ශ්‍රී විෂ්ණු දේවාල පෙරහැර මංගල්‍යය - 2017

රාජ්‍ය පරිපාලන හා ස්වදේශීය කටයුතු අමාත්‍යවරයා විසින් 175 වැනි අධිකාරය වූ වන්දනා ගමන් ආඥාපනතේ (2) දෙවන වගන්තිය යටතේ සාදනු ලබන නියෝගයන්ට අනුව 2008 අගෝස්තු මස 15 වැනි දිනැති රජයේ *ගැසට් පත්‍රය* මගින් හඟුරන්කෙත ඓතිහාසික ශ්‍රී විෂ්ණු දේවාල පෙරහැර *ගැසට්* කරන ලද පෙරහැරක් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත.

එකී නියෝග ප්‍රකාරව 2017 වර්ෂයට අදළව හඟුරන්කෙත ඓතිහාසික ශ්‍රී විෂ්ණු මහා දේවාල ඇසළ පෙරහැර 2017.08.22 වැනි දින සිට 2017.09.06 වැනි දින දක්වා පැවැත්වෙන බව සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මෙයින් නිවේදනය කරමි.

අමිල නවරත්න,
ප්‍රාදේශීය ලේකම්,
හඟුරන්කෙත.

2017ක් වූ අගෝස්තු මස 09 වැනි දින,
හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 974

---

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/23/2017/පිටු/සැ.

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2017.09.01 වැනි දින සිට 2017.09.15 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2017.09.22 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

නීල් ද අල්විස්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී දරන කොට්ඨාසයේ 336 වෙළුමේ 52 පත්‍රිරුව | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, රාගම් පත්තුවේ, අලුත්කුරු කෝරළේ, වත්තල කුඩා ඒදණ්ඩ පිහිටි 'පරන්ගි ඇටදන කුඹුර' නමැති ඉඩම සඳහා මායිම්,<br><br>උතුර : කළු ඔය,<br>නැගෙනහිර : නැසීගිය එම්. ප්‍රනාන්දුගේ ඔවිටපිටිය සහ ඒ. එම්. ප්‍රනාන්දුගේ දැනට ඩී. සී. ප්‍රනාන්දුගේ දේපළ,<br>දකුණ : පිලිප්පු ආරච්චිගේ වත්ත සහ යූ. ඒ. පෙරේරාගේ සහ අනෙක් අයගේ බිම<br>බටහිර සහ උ.බ. : ආර්. අන්දිරිස් පින්තුගේ සහ ආර්. ඇල්බෙයිනුගේ පින්තු කහවත්තවැල්ල නමැති ඉඩම සහ ඩී. ජේ. විජේගුණතිලකගේ වත්ත,<br><br>ප්‍රමාණය : අ. 11, රූ. 03. පර්. 30. | 01. ඩී. එල්. ගුණසේකර ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1939.04.26 වැනි දින අංක 2052 දරන තෑගි ඔප්පුව. |

08 - 1012

---

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/60/2017/පිටු/සැ.

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2017.09.01 වැනි දින සිට 2017.09.15 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2017.09.22 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

නීල් ද අල්විස්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් කොට්ඨාසයේ 977 වෙළුමේ 283 පත්‍රිරුව | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළේ, දෙපානම පිහිටි බෝගහකනත්ත කැබලි අංක 1 නමැති ඉඩම සඳහා මායිම්,<br><br>උතුර : දැනට එම්. බ්‍රම්පි පෙරේරාට සහ ගමගේ ලවිනිස් සිංඤෝට අයිති දේපළ,<br>නැගෙනහිරට : දැනට මොරගේ ජුවානාහාමිට අයිති දේපළ,<br>දකුණට : කැබලි අංක 2 සහ 3 ලකුණු කර තිබෙන ඉඩම,<br>බස්නාහිරට : දැනට ජී. කෝර්නේලිස් පෙරේරාට අයිති දේපළ.<br><br>ප්‍රමාණය : අ. 0, රූ. 0, පර්. 24.37. | 01. ඒ. එස්. ගුණවර්ධන ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1988.06.08 වැනි දින අංක 2218 දරන වරද නිවැරදි කිරීමේ ඔප්පුව.<br><br>02. ආර්. එම්. ධර්මසේන ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1993.09.20 වැනි දින අංක 376 දරන විකුණුම් ඔප්පුව. |

08 - 1013

---

**ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - කොත්මලේ**

කොත්මලේ මොරපේ ශ්‍රී කතරගම දේවාලයේ පෙරහැර මංගල්‍යය - 2017

**සියලු දෙනාගේ දැනගැනීම පිණිසයි**

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් 175 වැනි අධිකාරය වූ වන්දනා ගමන් ආඥපනතේ 02 වගන්තිය යටතේ සාදනු ලැබූ නියෝගයන්ට අනුව අංක 1,564 - 2008 අගෝස්තු මස 22 වැනි දිනැති රජයේ *ගැසට් පත්‍රය* මගින් කොත්මලේ, මොරපේ ශ්‍රී කතරගම දේවාල පෙරහැර ගැසට් කරන ලද පෙරහැරක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

02. එකී නියෝග ප්‍රකාරව, 2017 වසරට අදාළව කොත්මලේ, මොරපේ ශ්‍රී කතරගම දේවාල පෙරහැර මංගල්‍යය -

* 2017.09.20 - කප් සිටුවීම හා පිරිත් සජ්ඣායනය
* 2017.09.21 - වැනි දින සිට 2017.09.25 වැනි දින දක්වා ඇතුල් පෙරහැර
* 2017.09.26 - වැනි දින සිට 2017.09.30 වැනි දින දක්වා කුඹල් පෙරහැර
* 2017.10.01 - වැනි දින සිට 2017.10.05 වැනි දින දක්වා රන්දෝලි පෙරහැර
* 2017.10.06 වැනි දින දවල් පෙරහැර

ලෙස පැවැත්වෙන බව සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මෙයින් නිවේදනය කරමි.

ඊ. ආර්. එල්. බී. ඇටම්පාවල,
ප්‍රාදේශීය ලේකම්,
කොත්මලේ.

08 - 1097

---

**වන්දනා ගමන් ආඥපනත**

කැන්දවල ශ්‍රී විෂ්ණු මහා දේවාලයේ වාර්ෂික පෙරහැර මංගල්‍යය - 2017

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කැන්දවල ශ්‍රී විෂ්ණු මහා දේවාලයේ වාර්ෂිකව පවත්වනු ලබන පෙරහැර මංගල්‍ය 2017 සැප්තැම්බර් මස 02 වැනි දින පැවැත්වෙන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කෙරෙන රෙගුලාසිවල 2 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

එම්. ඒ. එස්. මාරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
ඉබ්බාගමුව.

08 - 1147

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## දැන්වීමයි

සී/ස උකුවෙල සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතියේ වාර්ෂික මහා සභා රැස්වීම 2017.11.12 වැනි ඉරිද ප.ව. 2.00ට උකුවෙල සණස සොබාදහම් ගොවිපල සහ කෘෂි පුහුණු මධ්‍යස්ථානයේ දී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. ඒ සඳහා සහභාගි වන ලෙස අපගේ සාමාජික මහත්ම මහත්මීන් වෙත ගෞරවයෙන් යුතුව ආරාධනා කරන්නෙමු. සාමාජික ඔබගේ සියලු අදහස් හා යෝජනා 2017.10.25 වැනි දිනට පෙර මාවෙත ඉදිරිපත් කරන ලෙස ද දන්වා සිටිමු.

ගරු ලේකම්.

2017 අගෝස්තු මස 15 වැනි දින,
සී/ස උකුවෙල ස.ණ.ස. සමිතිය,
උකුවෙල.

08 - 975

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංක පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව.

ණය ගිණුම් අංකය : 1943365.
පැනස්කා ඇකඩමි (ප්‍රයිවට්) ලිමිටඩ්.

2017 ජූලි මස 28 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් H. M. C. P. හේරත් විසින් 2015 ඔක්තෝබර් 15 වැනි දින සහතික කරන ලද අංක 2782 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හි නමට ලියන ලද්දා වූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ශ්‍රී ලංකාවේ නීතිය යටතේ නීත්‍යානුකූලව ස්ථාපිත සමාගමක් වන කොළඹ 5 හැව්ලොක් පාරේ අංක 104 දරන තැන ලියාපදිංචි කාර්යාලය පිහිටි පැනස්කා ඇකඩමි (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට සහ සපුකොටනගේ සංජීව බඹරන්ද උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හතලිස් තුන්ලක්ෂ දාහත්දහස් හාරසිය පනස් දෙකයි ශත අසූ පහක (රු. 4,317,452.85) මුදලක් 2017 අප්‍රේල් මස 25 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හට දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් හතලිස් තුන්ලක්ෂ දාහත්දහස් හාරසිය පනස් දෙකයි ශත අසූ පහක (රු. 4,317,452.85) මුදල අය කර ගැනීම සඳහා සහ 2017 අප්‍රේල් 26 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 4,116,000 ක මුදල මත 9.5% ක වැඩිදුර පොලියක් සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවාද අඩුකොට එකී අංක 2782 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හට උකස් කොට ඇත්තා වූ ද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපල සහ පරිශ්‍ර කොළඹ 12 හල්ස්ඩෝෆ් වීදියේ අංක 200 දරන ස්ථානයේ 2 වන මහලේ පිහිටි ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන් හි අනුඥාලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුල හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හිරිපිටිය, බණ්ඩාර මාවතේ, අංක 499 ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ හිරිපිටිය හි පිහිටි කෝන්ගහවත්ත නැමැති ඉඩමට (බලයලත් මිනින්දෝරු K. V. M. W. සමරනායක විසින් 2011 මාර්තු මස 08 වැනි දින මැන සාදන ලද අංක 4427 දරන පිඹුරේ ලොට් 1 අනුබෙදීමකි.) බලයලත් මිනින්දෝරු K. V. M. W. සමරනායක විසින් 2011 මාර්තු 23 වැනි දින මැන සාදන ලද අංක 4427A දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1G වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : ඩී. සමරසිංහ හිමිකම් කියන ඉඩමෙන් ද, නැගෙනහිරට : ලොට් 1H ද, දකුණට : ලොට් 1K සහ බස්නාහිරට : ලොට් 1F වලින් ද මායිම් වූ එකී අංක 4427A දරන පිඹුර ප්‍රකාරව පර්චස් විසි එකයි දශම පහයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 21.50)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියළුදේත් සමග වන මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරු A 23/96 යටතේ ලියාපදිංචි කර ඇත.

2. ඉහත කී කෝන්ගහවත්ත නැමැති ඉඩමට (බලයලත් මිනින්දෝරු K. V. M. W. සමරනායක විසින් 2011 මාර්තු 08 වැනි දින මැන සාදන ලද අංක 4427 දරන පිඹුරේ ලොට් 1 අනු බෙදීමකි) බලයලත් මිනින්දෝරු K. V. M. W. සමරනායක විසින් 2011 මාර්තු 23 වැනි දින මැන සාදන ලද අංක 4427 A දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1H වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : ඩී. සමරසිංහ හිමිකම් කියන ඉඩමෙන් ද, නැගෙනහිරට : ලොට් 1J ද, දකුණට : ලොට් 1K සහ බස්නාහිරට : ලොට් 1G වලින්ද මායිම් වූ එකී අංක 4427A දරන පිඹුර ප්‍රකාරව පර්චස් විසි එකයි දශම හයයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 21.60) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියළුදේත් සමග වන මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරු A 23/97 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් මාර්ග මතුපිටින් හා ඒ දිගේ එහා මෙහා යාමේ අයිතිය සමග වේ.

ඉහත කී හිරිපිටිය හි පිහිටි කෝන්ගහවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු K. V. M. W. සමරනායක විසින් 2011 මාර්තු මස 23 වැනි දින මැන සාදන ලද අංක 4427A දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1K වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : 1A සිට 1H දක්වා සහ 1J වලින්ද, නැගෙනහිරට : අංක 76/1630 දරන පිඹුරේ ලොට් 3C ද, දකුණට : බණ්ඩාර මාවතෙන්ද සහ බස්නාහිරට : දොලේකඩේ පාරෙන්ද මායිම් වූ එකී අංක 4427A දරන පිඹුර ප්‍රකාරව පර්චස් නමයයි දශම හතරයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 9.40) විශාලත්වයෙන් යුක්ත වන මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව A 23/88 යටතේ ලියාපදිංචි කර ඇත.

රංජනී ගමගේ,
සමාගම් ලේකම්.

2017 අගෝස්තු මස 08 වැනි දින,

08 - 1061

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි (ලියාපදිංචි අංකය පී.කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ගිණුම් අංකය :- 1035115.
සපුකොටනගේ සංජීව බඹරැන්ද.

2017 ජූලි මස 28 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් R.A.M.N. රාජසූරිය විසින් 2011 දෙසැම්බර් මස 01 වැනි දින සහතික කරන ලද අංක 616 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි නමට ලියන ලද්ද වූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, සපුකොටනගේ සංජීව බඹරැන්ද ණයකරු වශයෙන් පැහැරහැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හැටහත්ලක්ෂ අසූඑක්දහස් හාරසිය හැත්තෑඅටයි ශත දහනමයක (රු. 6,781,478.19) මුදලක් 2017 අප්‍රේල් 25 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හට දැන් අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින්, එකී රුපියල් හැටහත්ලක්ෂ අසූඑක්දහස් හාරසිය හැත්තෑඅටයි ශත දහනමයක (රු. 6,781,478.19) මුදල අයකර ගැනීම සඳහා සහ 2017 අප්‍රේල් මස 26 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 6,349,398.13ක මුදල මත 13.36% (AWPLR+2%) වැඩිදුර වාර්ෂික පොලිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ද ඇතුලුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවාද අඩු කොට එකී අංක 616 දරන බැඳුම්කරය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හට උකස් කොට ඇත්තාවූ ද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍ර කොළඹ 12 හල්ෆ්ඩොප් වීදියේ අංක 200 හි 2 වන මහලේ ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන් හි අනුඥලත් වෙන්දේසිකරු L. B. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

#### ඉහත සඳහන් කළ උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේපත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ හිරිපිටිය හි පිහිටි කෝන්ගහවත්ත නැමති ඉඩමට (බලයලත් මිනින්දෝරු K. V. M. W. සමරනායක විසින් 2011 මාර්තු මස 08 වැනි දින මැන සාදන ලද අංක 4427 දරන පිඹුරේ ලොට් 1 අනු බෙදීමකි). බලයලත් මිනින්දෝරු K. V. M. W. සමරනායක විසින් 2011 මාර්තු මස 23 වැනි දින මැන සාදන ලද අංක 4427A දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද ලොට් 1G වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : ඩී. සමරසිංහ හිමිකම් කියන ඉඩමෙන් ද, නැගෙනහිරට : ලොට් අංක 1H ද, දකුණට : ලොට් 1K සහ බටහිරට : ලොට් 1F වලින්ද මායිම් වූ එකී අංක 4427A දරන පිඹුර ප්‍රකාරව පර්චස් විසි එකයි දශම පහයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 21.50) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේපත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ හිරිපිටිය හි පිහිටි කෝන්ගහවත්ත නමැති ඉඩමට (බලයලත් මිනින්දෝරු K. V. M. W. සමරනායක විසින් 2011 මාර්තු මස 08 වැනි දින මැන සාදන ලද අංක 4427 දරන පිඹුරේ ලොට් 1 අනු බෙදීමකි) බලයලත් මිනින්දෝරු K. V. M. W. සමරනායක විසින් 2011 මාර්තු මස 23 වැනි දින මැන සාදන ලද අංක 4427A දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද ලොට් 1H වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : ඩී. සමරසිංහ හිමිකම් කියන ඉඩමෙන් ද, නැගෙනහිරට : ලොට් අංක 1J ද, දකුණට : ලොට් 1K සහ බටහිරට : ලොට් 1G වලින්ද මායිම් වූ එකී අංක 4427A දරන පිඹුර ප්‍රකාරව පර්චස් විසි එකයි දශම හයයි බිංදුව (අ:0 රූ:0 පර්:21.60) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

ඉහත සඳහන් ලොට් 1G සහ 1H දරන ඉඩම අතුරු කොටස් කිරීමෙන් පසුව පහත සඳහන් පරිදි සවිස්තරව විස්තර වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේපත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ හිරිපිටිය හි පිහිටි කෝන්ගහවත්ත නමැති ඉඩමට (බලයලත් මිනින්දෝරු K. V. M. W. සමරනායක විසින් 2011 මාර්තු 08 වැනි දින මැන සාදන ලද අංක 4427 දරන පිඹුරේ ලොට් 1 අනු බෙදීමකි). බලයලත් මිනින්දෝරු K. V. M. W. සමරනායක විසින් 2011 මාර්තු 08 වැනි දින මැන සාදන ලද අංක 4427 දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : D. R. ජයසිංහ,

D.සමරසිංහ සහ D. C. S. හෙට්ටිආරච්චි හිමිකම් කියන අංක 76/1630 දරන පිඹුරේ ලොට් 2A ද, නැගෙනහිරට : අංක 76/1630 දරන පිඹුරේ ලොට් 3C ද, දකුණට : බණ්ඩාර මාවතෙන් ද සහ බටහිරට : අංක 76/1630 දරන පිඹුරේ ලොට් 2A සහ පාරෙන් ද, මායිම් වූ එකී අංක 4427 දරන පිඹුර ප්‍රකාරව අක්කර එකයි රූඩ් එකයි පර්චස් තුනයි දශම හතරයි බිංදුව (අ:1 රූ:1 පර්:3.40) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

ඉහත සඳහන් ඉඩම නැවත මැනීමකින් පසු පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලෙපත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ හිරිපිටිය හි පිහිටි කෝන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු P. වැලිකල විසින් 2009 පෙබරවාරි 27 වැනි දින මැන සාදන ලද අංක 1425 දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : D. R. ජයසිංහ, D.සමරසිංහ සහ D. C. S. හෙට්ටිආරච්චි හිමිකම් කියන අංක 76/1630 දරන පිඹුරේ ලොට් 2A ද, නැගෙනහිරට : අංක 76/1630 දරන පිඹුරේ ලොට් 3C ද, දකුණට : බණ්ඩාර මාවතෙන් ද සහ බටහිරට : අංක 76/1630 දරන පිඹුරේ ලොට් 2A සහ පාරෙන් ද, මායිම් වූ එකී අංක 1425 දරන පිඹුර ප්‍රකාර, අක්කර එකයි රූඩ් එකයි පර්චස් තුනයි දශම හතරයි බිංදුව (අ:1 රූ:1 පර්:3.40) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රය A 23/27 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් මාර්ග මතුපිටින් හා ඒ දිගේ එහා මෙහා යාමේ අයිතිය සමඟ වේ.

ඉහත කී හිරිපිටිය හි පිහිටි කෝන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු K. V. M. W. සමරනායක විසින් 2011 මාර්තු 23 වැනි දින මැන සාදන ලද අංක 4427A දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද ලොට් 1K වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : ලොට් 1A සිට 1H දක්වා සහ 1J වලින් ද, නැගෙනහිරට : අංක 76/1630 දරන පිඹුරේ ලොට් 3C ද, දකුණට : බණ්ඩාර මාවතෙන් ද සහ බටහිරට : දෙලේකඩේ පාරෙන් ද මායිම් වූ එකී අංක 4427A දරන පිඹුර ප්‍රකාරව පර්චස් නමයයි දශම හතරයි බිංදුව (අ:0 රූ:0 පර්:9.40) ක විශාලත්වයෙන් යුක්ත වන මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි මෙය කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රය A 23/88 යටතේ ලියාපදිංචි කර ඇත.

රංජනී ගමගේ මිය
සමාගම් ලේකම්.

2017 අගෝස්තු මස 08 වැනි දින.

08 - 1062

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මුතිය

ණය ගිණුම් අංකය :- 1991573 - 2004586 - 2009501 - 2011289 - 2017016 - 2022729 - 2031635 - 2034466 - 2043595 සහ 2045116. කන්දේගෙදර සෙයියඩ් මොහමඩ් මොහමඩ් අලවි.

2017 ජූලි මස 28 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලරැස්වීමේ දී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් කේ. වී. ඒ. ඩී. සී. කේ. විපුලසේන විසින් සහතික කරන ලද 2015 ජුනි මස 10 වැනි දින අංක 1561 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී නමින් වූ බැඳුම්කරය යටතේ කන්දේගෙදර සෙයියඩ් මොහමඩ් මොහමඩ් අලවි අය බන්ධනදයි වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එකසිය විසි හතර ලක්ෂ හැත්තෑ එක් දහස් දෙසිය අනූ දෙකයි ශත විසිහතක (රු. 12,471,292.27) මුදලක් 2017.05.30 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් එකසිය විසි හතර ලක්ෂ හැත්තෑ එක් දහස් දෙසිය අනූ දෙකයි ශත විසිහතක (රු. 12,471,292.27) මුදල හා 2017.05.31 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 11,500,000 මුදලක් සඳහා වාර්ෂිකව 10.5%ක් බැගින් වූ වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් හා වෙනත් යම් ගෙවීමක් ඇතොත් ඒවා ද මේ වන විට කරනු ලැබූ (යම්) ගෙවීමක් ඇතොත් එය ද අඩුකර අයකර ගැනීම සඳහා එකී අංක 1561 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. වෙත උකස්කර ඇති මෙහි පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කරන ලද දේපළ හා පරිශ්‍රයන් මහනුවර, මාවිල්මඩ, ලේවැල්ල පාර, දුටුගැමුණු මාවතේ, අංක 369/1 හි බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් සම්මත කර ගනී.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව පල්ලේගම්පහ කෝරළේ, පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ පූජාපිටිය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ දිවානවත්ත ග්‍රාම නිලධාරි වසම හි පිහිටි බමුණුපොල ගමේ දිවනි වත්ත නොහොත් පල්කඩේ වත්ත (සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද අංක මහා 1154 දරන පිඹුරේ සඳහන් ලොට් 5 හි උපබෙදුමක්) නමැති ඉඩමට බලයලත් මානක R. B. විජේකෝන් විසින් 2006 මාර්තු මස 26 වැනි දින මැන සාදන ලද අංක 3008 දරන පිඹුරේ නිරූපිත බෙද වෙන් කරන ලද ලොට් 01 නමැති ඉඩම් කොටසට මායිම් එනම්, උතුරු

නැගෙනහිරට : : සෙයියදු මොහමඩ් හිමිකම් පාන මල්වත්ත ද, දකුණු නැගෙනහිරට : සෙයියදු මොහමඩ් හිමිකම් පාන මල්වත්ත ද, දකුණු සහ බස්නාහිරට : ලොට් 02 සහ කේ. එස්. එම්. අනාස් හිමිකම් පාන ඉඩමෙන් ද සහ උතුරු බස්නාහිරට : සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද පිඹුරු අංක 1154 හි ලොට් 4 න් ද යන මෙකී මායිම් තුළ පිහිටි ගහකොළ වගාව ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියලු දේ, ඉඩමේ ප්‍රමාණය රූඩ් එකයි පර්චස් එකයි දශම දෙකයි (අ. 0, රූ. 1, පර්. 1.20) මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව H 826/5 යටතේ ලියාපදිංචි කර ඇත.

රංජනි ගමගේ මිය,
සමාගම් ලේකම්.

08 - 1078

---

**පැන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - කොල්ලුපිටිය ශාඛාව**

1990 අංක 4 දරන බැංකු විසින් ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ගණුදෙනුකරුගේ නම : කරවිට විදනෙලාගේ දෙන් කපිල කිත්සිරි ගෝඨාභය

පැන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2017.05.31 වැනි දින පවත්වන ලද රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

"එනම්, කරවිට විදනෙලාගේ දෙන් කපිල කිත්සිරි ගෝඨාභය "බන්ධනදයී" වශයෙන් කලින් පැන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පැන් ඒෂියා බෑන්ක් ලිමිඩට් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පී.කිව්. 48 දරන පැන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ආර්. එල්. සී. රණසිංහ විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2016.07.18 දිනැති අංක 946 දරන උකස් බැඳුම්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර ඇති හෙයින් ද,

එකී අංක 946 දරන උකස් බැඳුම්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් 2017.05.03 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය ද, වශයෙන් රුපියල් හැත්තෑ තුන් ලක්ෂ හැත්තෑ දෙදහස් දෙසීය හතළිස් අටයි ශත අසූ හයක (රු. 7,372,248.86) මුදල සහ එකී මුදල ගෙවනු ලබන තෙක් 2017.05.04 වැනි දින සිට රුපියල් හැත්තෑ එක් ලක්ෂ තුන් දහස් හැත්තෑවයි ශත අනූ දෙකක (රු. 7,103,070.92) මුදල මත වාර්ෂිකව 19% බැගින් පොළිය ද, පැන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේ ද යත්,

එකී අංක 946 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් හැත්තෑ තුන් ලක්ෂ හැත්තෑ දෙදහස් දෙසීය හතළිස් අටයි ශත අසූ හයක (රු. 7,372,248.86) මුදල ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළිය ද, ගාස්තු ද වර්ෂ 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ බැංකුව වෙත කරවිට විදනෙලාගේ දෙන් කපිල කිත්සිරි ගෝඨාභය විසින් උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 182/3 (50/3) දරන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකාර තුසිත් කරුණාරත්න වෙත එකී වර්ෂ 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙස ය."

**උපලේඛනය**

සබරගමුව පළාතේ (රත්නපුරය ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කඩවත කෝරළේ, උඩුවග්ගම් පත්තුවේ, ඉඹුල්පේ ප්‍රාදේශීය සභා සීමාවේ, ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අමුපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අමුවතුගොඩ සහ අතුතුවර ග්‍රාමයන්හි පිහිටා ඇති කීනගහඇල්ල එස්ටේට් නමැති ඉඩමට බලයලත් මානක ඒ. එස්. අයි. රත්නම් විසින් ලියා සහතික කරන ලද වර්ෂ 1988.07.31 දිනැති අංක 1748 දරන පිඹුරේ, ලොට් 1 සිට 10 දරන ඉඩම් කොටස්වලට මායිම්, උතුරට : අමුවතුගොඩ ගම සහ එෆ්.වී.පී 462හි ලොට් 60 ද, නැගෙනහිරට : ලොට් 56 ද, දකුණට : ලොට් 56 ද සහ බස්නාහිරට : ලොට් 196 සහ ලොට් 72 ද මගින් මායිම් වූ එකී අංක 1748 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් අක්කර හතළිස් හයයි පර්චස් තිස් දෙක (අ. 46, රූ. 0, පර්. 32ක් ඉඩම සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ සහ සියලු දේද වන අතර මෙම ඉඩම රත්නපුර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ වෙළුම/පත්‍රිරු ඩී 253/239හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

උදිතා කොඩිකාර,
කළමනාකාරිණි - ණය අයකර ගැනීම්.

08 - 1108

---

**සෙලාන් බැංකුව පීඑල්සී - හෝමාගම ශාඛාව**
(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය :- 0430-33304427-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2017 ජූලි මස 26 වැනි දින පවත්වනට යෙදුනු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් බුලත්ගමගේ මොනිකා ගුණවර්ධන විසින් සහතික කරන ලද 2015 මැයි මස 26 දිනැති අංක 1535 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, හෝමාගම පදිංචි වරුණ ප්‍රසන්න උල්ලුවිශේවා, යද්දෙහිගේ අනෝජා ප්‍රියදර්ශනී සහ චතුමිණි විශ්මිකා උල්ලුවිශේවා යන අය බන්ධනදායීන් වශයෙන් රුපියල් අසූහතර ලක්ෂ හැත්තෑ හය දහස් හාරසිය හැත්තෑ අටයි ශත හතළිස් එකක (රු. 84,76,478.41) මුදලක්, 2017 අප්‍රේල් මස 13 වැනි දින සිට වසරකට සියයට විසිහතර (24%) බැගින් පොලියක් සමග ස්ථිර අයිරා අණකර පහසුකම් සම්බන්ධයෙන් 2017 අප්‍රේල් මස 12 වැනි දින වන විට, එකී බැඳුම්කරය මත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී මුළු මුදල වන රුපියල් අසූහතර ලක්ෂ හැත්තෑ හය දහස් හාරසිය හැත්තෑ අටයි ශත හතළිස් එකක (රු. 84,76,478.41) මුදල, විකිණීමේ දිනය දක්වා කාලයට පෙරකී පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ තදනන්තරව ලැබී ඇති යම්කිසි මුදලක් (ඇත්නම්) එකී මුදල අඩුකර අයකර ගැනීම පිණිස, එකී අංක 1535 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇත්තා වූ මෙහි සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකරු තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය සභා සීමාව තුළ ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සීමාව තුළ නාරංවල අංක 284 ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ නාරංවල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එල්. ජේ. ලියනගේ විසින් සාදන ලද 2014.10.17 දිනැති අංක 9587ඒ දරන සැලැස්මේ නිරූපනය වන වෙලබඩවත්ත නමැති, ගොඩනැගිල්ල, ගස්, වගා සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩමේ ලොට් 63ඒ1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, ඊසානට : මල්කාන්ති සොලමන් විසින් හිමිකම් කියනු ලබන අංක 1935 සැලැස්මේ සඳහන් ලොට් 62 ද, ගිණිකොණට : අංක 1935 සැලැස්මේ සඳහන් ලොට් 77 (20ක් පළල ප්‍රාදේශීය සභා පාර) නිරිතට : අංක 1935 සැලැස්මේ සඳහන් ලොට් 74 (20ක් පළල ප්‍රාදේශීය සභා පාර) සහ වයඹට : අංක 1935 සැලැස්මේ සඳහන් ලොට් 64 යන මායිම තුළ එකී අංක 9587ඒ දරන සැලැස්ම අනුව පර්චස් පහළොවයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 0. පර්. 15.50) ක් විශාල ඉඩම.

අංක 9587ඒ සැලැස්මේ නිරූපනය වන එකී ලොට් 63ඒ1 පහත සවිස්තරව විස්තර කරනු ලබන ඉඩමේ නැවත මැනීමක් වේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය සභා සීමාව තුළ නාරංවල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එල්. ජේ. ලියනගේ විසින් සාදන ලද 2004.09.24 දිනැති අංක 9587 දරන සැලැස්මේ නිරූපනය වන වෙලබඩවත්ත නමැති ගොඩනැගිල්ල, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් 63ඒ ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, ඊසානට : එම්. සොලමන්ට අයිති අංක 1935 සැලැස්මේ නිරූපනය වන ලොට් 62 ද, ගිණිකොණට : අංක 1935 සැලැස්මේ නිරූපනය වන ලොට් 77 (20ක් පළල පාර), නිරිතට : අංක 1935 සැලැස්මේ නිරූපනය වන ලොට් 74 සහ වයඹට : අංක 1935 සැලැස්මේ නිරූපනය වන ලොට් 64 යන මායිම් තුළ එකී අංක 9587 දරන සැලැස්ම අනුව පර්චස් පහළොවයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 0. පර්. 15.50) ක් විශාල ඉඩම.

(මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය සහ පත්‍රිරුව සී 962/148 යටතේ ලියාපදිංචි කර ඇත.)

අංක 9587 දරන සැලැස්මේ සඳහන් එකී ලොට් 63ඒ පහත විස්තර කරනු ලබන ඉඩමේ නැවත මැනීමක් වේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය සභා සීමාව තුළ නාරංවල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සාදන ලද 1985.05.21 දිනැති අංක 1935 දරන සැලැස්මේ නිරූපනය වන වෙලබඩවත්ත නමැති ගොඩනැගිල්ල, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් එක්ස් ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, ඊසාණට : ලොට් 62 ද, ගිණිකොණට : ලොට් 77 ද, නිරිතට : ලොට් 74 සහ වයඹට : ලොට් 64 යන මායිම් තුළ එකී අංක 1935 දරන සැලැස්ම අනුව පර්චස් පහළොවයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 0. පර්. 15.50) ක් විශාල ඉඩම. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය සහ පත්‍රිරුව සී 962/148 යටතේ ලියා පදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෞශල්‍යා හැච් මිය,
දෙපාර්තමේන්තු ප්‍රධානි - නීති.

08 - 1115/1

---

### සෙලාන් බැංකුව පීඑල්සී - බදුල්ල ශාඛාව

(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය :- 0260-02652701-001

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2017 ජූලි මස 26 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත). ප්‍රසිද්ධ නොතාරිස් රේණුකා උඩුවන මෙය විසින් සහතික කරන ලද 2014 අගෝස්තු මස 07 දිනැති අංක 248 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, හාලිඇල සිට දූන් බදුල්ලෙහි පදිංචි මුදලිහේවගේ තුසිත මුදලිහේවා යන අය බන්ධනදැයීන් වශයෙන් රුපියල් අසූහත් ලක්ෂ පහළොස් දහස් අනූ අටයි ශත තිස් අටක (රු. 8,715,098.38) මුදලක් මත 2017 ජූනි මස 07 වැනි දින සිට වසරකට සියයට දහතරයි දශම පහක (14.5%) බැගින් පොලියක් සමග පියස සිරිනිවාස නිවාස ණය පහසුකම සම්බන්ධයෙන් එකී බැඳුම්කරය මත රුපියල් අනූ දෙලක්ෂ පනස් හත් දහස් හාරසිය තිහයි ශත අනූවක මුදලක් (රු. 92,57,430.90) මුදලක් 2017 ජූනි මස 06 වැනි දින වන විට, සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී මුළු මුදල වන රුපියල් අනූ දෙලක්ෂ පනස් හත් දහස් හාරසිය තිහයි ශත අනූවක මුදලක් (රු. 92,57,430.90) මුදලක්, විකිණීමේ දිනය දක්වා කාලයට පෙරකී පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ තදනන්තරව ලැබී ඇති යම්කිසි මුදලක් (ඇත්නම්) එකී මුදල අඩුකර අයකර ගැනීම පිණිස, එකී අංක 248 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇත්තා වූ මෙහි සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකරු තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල මහ නගර සභා සීමාව තුළ බදුල්ල (මධ්‍යම) ග්‍රාම නිලධාරි කොට්ඨාස අංක 78ඩී හි මැදවෙලගම පිහිටි බලයලත් මිනින්දෝරු එම්. කේ. සී. ප්‍රේමචන්ද්‍ර විසින් සාදන ලද 1990 නොවැම්බර් මස 18 දිනැති අංක 1993 දරන සැලැස්මේ ලොට් අංක 3 සහ 4 ලෙස නිරූපනය වන මැදවෙලගන්නිලේ කුඹුර සහ කුඩාමුත්තෙට්ටුව නමැති සහ හඳුන්වනු ලබන, බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : බ.මි. එම්. කේ. සී. ප්‍රේමචන්ද්‍ර විසින් සාදන ලද 1990.11.18 දිනැති අංක 1993 දරන සැලැස්මේ ලකුණු කරන ලද මාර්ග ප්‍රවේශය වන ලොට් අංක 1 සහ 2 ද, නැගෙනහිරට : බ.මි. එම්. කේ. සී. ප්‍රේමචන්ද්‍ර විසින් සාදන ලද 1990.11.18 දිනැති අංක 1993 දරන සැලැස්මේ ලකුණු කරන ලද මාර්ග ප්‍රවේශය වන ලොට් අංක 2 ද, දකුණට : බ.මි. එම්. කේ. සී. ප්‍රේමචන්ද්‍ර විසින් සාදන ලද 1990.11.18 දිනැති අංක 1993 දරන සැලැස්මේ සඳහන් ලොට් 6 සහ බස්නාහිරට : රජයේ ඉඩම වෙන් කෙරෙන පැළ ඉණි වැට ද යන මායිම් තුළ පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20.)ක් විශාල, නිවස/ගොඩනැගිලි, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම, මෙය බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිකාව ඒ 109/138හි ලියාපදිංචි කර ඇත. පහත සඳහන් ඉඩම් උඩින් සහ දිගේ මාර්ග අයිතිය සමග.

ඉහත සඳහන් ඉඩම බලයලත් මිනින්දෝරු එම්. පී. ගුණරත්න විසින් සාදන ලද 2014.07.25 දිනැති අංක 5401 සැලැස්මේ පෙන්නුම් කර සහ එකතුකර සහ නැවත මැන පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල මහ නගර සභා සීමාව තුළ බදුල්ල (මධ්‍යම) ග්‍රාම නිලධාරි කොට්ඨාස අංක 78ඩී හි මැදවෙලගම පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ජී. ගුණරත්න විසින් සාදන ලද 2014.07.25 දිනැති අංක 5401 දරන සැලැස්මේ සඳහන් ලොට් අංක 1 ලෙස නිරූපනය වන මැදවෙලගන්නිලේ කුඹුර සහ කුඩාමුත්තෙට්ටුව නමැති සහ හඳුන්වනු ලබන, බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර ද, නැගෙනහිරට : පාර ද, දකුණට : බ.මි. එම්. කේ. සී. ප්‍රේමචන්ද්‍ර විසින් සාදන ලද 1990.11.18 දිනැති අංක 1993 දරන සැලැස්මේ සඳහන් ලොට් 6 සහ බස්නාහිරට : රජයේ ඉඩම ද යන මායිම් තුළ පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20)ක් විශාල, නිවස/ගොඩනැගිලි, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල මහා නගර සභා සීමාව තුළ බදුල්ල (මධ්‍යම) ග්‍රාම නිලධාරි කොට්ඨාස අංක 78ඩී හි මැදවෙලගම පිහිටි බලයලත් මිනින්දෝරු එම්. කේ. සී. ප්‍රේමචන්ද්‍ර විසින් සාදන ලද 1990 නොවැම්බර් මස 18 දිනැති අංක 1993 දරන සැලැස්මේ ලොට් අංක 1 සහ 2 ලෙස නිරූපනය වන මැදවෙලගන්නිලේ කුඹුර සහ කුඩාමුත්තෙට්ටුව නමැති සහ හඳුන්වනු ලබන, බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : බ.මි. එම්. පුවාඩ් ඉස්මයිල් විසින් සාදන ලද 1982 මැයි 18 දිනැති අංක 1888 දරන සැලැස්මේ ලකුණු කළ ලොට් අංක 8 (බණ්ඩාරනායක මාවත සිට එකී අංක 1888 සැලැස්මේ සඳහන් එකී ලොට් 5, 6 සහ 7ට යන ප්‍රවේශ මාර්ගය) සහ එකී අංක 1888 සැලැස්මේ සඳහන් එකී ලොට් අංක 5 ද, නැගෙනහිරට : බ.මි. එම්. කේ. සී. ප්‍රේමචන්ද්‍ර විසින් සාදන ලද 1990.11.18 දිනැති අංක 1993 දරන සැලැස්මේ සඳහන් ලොට් අංක 5 ද, දකුණට : බ.මි. එම්. කේ. සී. ප්‍රේමචන්ද්‍ර විසින් සාදන ලද 1990.11.18 දිනැති අංක 1993 දරන සැලැස්මේ සඳහන් ලොට් 6, 4 සහ 3 සහ බස්නාහිරට : බ.මි. එම්. කේ. සී. ප්‍රේමචන්ද්‍ර විසින් සාදන ලද 1990.11.18 දිනැති අංක 1993 දරන සැලැස්මේ ලකුණු කළ ලොට් 4 සහ පැළ ඉණි වැට සහ රජයේ ඉඩම වෙන් කෙරෙන කම්බි වැට ද යන මායිම් තුළ පර්චස් හයයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 6.50)ක් විශාල, ඉඩම උඩින් සහ දිගේ මාර්ග අයිතිය සහ එය භාවිතා කිරීමට නෛතික හිමිකම් ඇති අනිකුත් අය සමග පොදු පාවිච්චිය සමග. මෙය බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිකාව ඒ 110/97හි ලියාපදිංචි කර ඇත.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල මහා නගර සභා සීමාව තුළ බදුල්ල (මධ්‍යම) ග්‍රාම නිලධාරි කොට්ඨාස අංක 78ඩී හි

මැදවෙලගම පිහිටි බලයලත් මිනින්දෝරු එම්. එම්. පුවාඩ් ඉස්මයිල් විසින් සාදන ලද 1982 මැයි මස 18 දිනැති අංක 1888 දරන සැලැස්මේ ලොට් අංක 8 ලෙස නිරූපනය වන මැදවෙලගන්නිලේ කුඹුර සහ කුඩාමුත්තෙට්ටුව නමැති සහ හඳුන්වනු ලබන, බෙද වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : බණ්ඩාරනායක මාවත සහ කැප්පෙටිපොල පාර ද, නැගෙනහිරට : ලොට් අංක 1, 4, 5 සහ 6 ද, දකුණට : බ.මී. එම්. කේ. සී. ප්‍රේමචන්ද්‍ර විසින් සාදන ලද 1990 නොවැම්බර් මස 18 දිනැති අංක 1993 දරන සැලැස්මේ සඳහන් ලොට් අංක 1 සහ බස්නාහිරට : සිවසුබ්‍රමනියම් මියගේ වත්ත සහ රජය විසින් අත්පත් කරගත් ඉඩම ද යන මායිම් තුළ පර්චස් දහතුනක (අ. 0, රූ. 0, පර්. 13)ක් විශාල, ඉඩම උඩින් සහ දිගේ මාර්ග අයිතිය සහ එය භාවිතා කිරීමට නෛතික හිමිකම් ඇති සහ අනිකුත් අය සමග පොදු පාවිච්චිය සමග. මෙය බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍ඉරුව ඒ 110/98 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෞශල්‍යා හැච් මිය,
දෙපාර්තමේන්තු ප්‍රධානී - නීති.

08 - 1115/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.